# (අ)වාසනාවන්ත මරණය....

## ප්‍රනීත් කාරියවසම්

කෝ.. කෝ.. ටිකක් ඉඩ දෙන්න
නංගී, මේ බීම ටික අල්ලන්න..
එන්න ඇතුලට..මෙහෙන් වාඩි වෙන්න

අනේ බලන්නකෝ..., වෙච්ච දේ..
නින්දෙන්මයි පණ ගියේ
ඒත් එක අතකට හොඳයි
දුක් වින්දේ නැහැනේ.

ඔව්, මගේ එකම අක්කා
තමයි එයා...
ලෙඩින් හිටියෙත් නැහැ..
අයියට නම් තිබුනා ටිකක්
සීනි......

ඔව්, අර පුටුවක් තියන් ඉන්නේ
එයා තමයි, මහත්තයා අක්කාගේ.....
අර ෆොටෝ එකේ ඉන්නේ එයාලගේ
පුතයි දුවලා දෙන්නයි...

පුතා නම් ඉංජිනේරුවෙක්,
දැන් ඉන්නේ ඕස්ට්‍රේලියාවේ
හොඳ පඩි, දැන් අවුරුදු 5 මගේ හිතේ..

ලොකු දුවත් බැඳලා ගියේ
එංගලන්තෙටනේ..........
දැන් නම් උගන්නනවලු
ඉස්කෝලෙක එහේ...

පොඩ්ඩි නම් ඉන්නේ කැනඩාවේ..
එක පුතෙක් මේ පාර ගන්නවලු
ලොකු විභාගයක්.....එන්න විදියක් නැහැලු

නිවාඩු ගන්නත් බැහැලු හදිසියේ
නැත්නම් මෙලහටත් ඔය ළමයි
ඇවිත්.........

ලොකු රක්ෂාවල් කරනකොට
ලේසිත් නැහැනේ, එහෙම එන්න
මෙහෙ වගෙත් නෙමෙයිනේ..

හදිසියෙන් ආවමත් ලොකු ගානක්
යනව ඇති ටිකට් වලටම......
හත් දවසේ දානෙට නම් එයි
අනිවාරෙන්ම ඔක්කොම

බලන්නකෝ.....
ලස්සනට කරයි
දානේ වැඩ ටික..



# තබා යමි මේ කවිය නුඹේ සවනත

## ඩොමිනික් චන්ද්‍රසාලි

ලියා අවසන් කළ කවියක
එළිවැට ලිහී යයි
ගල්කිස්ස සයුරු රළ මත

නික්ම යන කංසා දුම් වළලු අද්දර
දුෂ්කරයි වුනත් පා වෙලා යමි
ඉන්ද්‍රජාලික හීනයක් වගේ
ඈත අපරදිග අහසට

පාට සළු පිළි පිරුණු
සීත කළ පාට රෙදි සාප්පුවක් ළඟ
පාර මාරුවෙන තැන ඇන්ද
කහ ඉරි පවා මැකී ඇත

බීර පෙණ පවා ගිනි ගන්න සවසක
නොනවතින දුක්'දුළු වැසි හැලෙයි
කොල්ලුපිටියේ හංදියට,
වහා වෙඩි තබන්නට පෙර
හිස්ව ගිය සරත්කල රෑ අහසට
තබා යමි මේ කවිය
රෝස ඉඳුවර පෙති යට

# කඩදාසි මෝලේ කියැවුණු කවිය

## ජගත් වෙත්තසිංහ

අහුලාගෙන
පයට පෑගී බිම තිබුණු
පරණ සිගරැට් පැකට්ටුවක්
ලියන්නට
සේකරට ඇත කවියක්

වතුර උගුරක් පිණිස
නොමැත කිසි ඉසිඹුවක්
වතා වේගෙන් දුවන
හඬ නගන යන්තාරේ
ගණියාමත් ඔප වැටී
නිම වෙමින් ගොඩ හැගෙන
මට සිළුටු
යෝධ කදෙහි බේලයක් මත
ලියන්නට නැත කවියක්.............
හෙළන්නට ඇත කඳුලක්............




# නුඹේ පෙම භයංකර සත්‍යයකි

## සුභද්‍රා ජයසුන්දර

අඩක් සියවස් අඩක් අත් නෑර නොනැවතී
ළය පලා පුදන්නැයි බල කරන
නුඹේ පෙම භයංකර සත්‍යයකි

අතින් පන්දම දරා, නෙතින් කලුවර හලා
මනමාල ලුසිෆර් පැමිණි තැන
හද දැගර වී තිබුනි සර්පයෙකු වාගේම
ආලෝකය ද අඳුර ද
එක්වරම නැගුණු තැන
ළය සුසැදි රන්මුවා සර්පිලය දකින්නට
යුක්ලීඩ්ටත් වඩා කාලයක්,
හදවතට ඇහ ගහන් කල් මරන
නුඹේ පෙම භයංකර සත්‍යයකි

පාෂාණීභූත මැණික් කටු සහ ඉපිල්ලුණු නිල් නහර ද
පැරණි දිගු සීසේරියන් කැලැල්ද
තවම තුණු ඇහි පියෙන් පිරිමදින
මට රිදේයැයි සිතා
නින්දෙනුත් මගේ හිස සකසවන - නුඹේ පෙම
පලමු ඒක භාර්යා පවුල පටන් ගත් දවස වාගේම
භයංකර සත්‍යයකි

ප්‍රේමය තරම් පරිපූර්ණ
සර්පිලාකාර නිමැවුම්
අතීතය වෙත යන්න නුඹ සදන මග මරා
අලුත් ඉරි මගේ නලලත තබන
නාගයින් හැව අරින රාත්‍රිය පුරාවට,

කප් කෙලක් කප් නෑර එකම සිතකට බැඳුණු
සිදුහත්ගෙ අතාර්කික ප්‍රේමයට අරුත් දුන්
නුඹේ පෙම භයංකර සත්‍යයකි

ඉදින් මට හද පලා පිදිය හැක
එසේ වුව සර්පිලය එයමය
අඩක් සියවස් අඩට මුල පිරුව
කාල පථයට නැවත පිවිසෙන්න
ඒතරම් වේගයක් මට නැත
වේගවත් වස්තූන් දිගු නැත

# ගාඩිනියා මල

## ශාමා හේවාවිතාරණ

රාජගිරිය

ගාඩිනියා මල ගාඩිනියා
කියන්න එව්වේ කව්ද කියා
උපන්දිනය මගෙ සිහි කරලා
එවනව මට මල් ගාඩිනියා

සිත පිරුණා සිත පිරුණා
ලැබුණා මට පෙම්වතෙක් කියා
සිතුවිලි මගෙ දුර විසිර ගියා
නොලැබුණ ඒ පෙම්වතා සොයා

කවදාවත් දුටුවෙත් නෑ
සිහින කුමරු ආවෙත් නෑ
අවසානෙදි ඉතිරි වුණේ
මල පමණයි ගාඩිනියා

# මැති සබය

## ප්‍රේමවංශ දසනායක

අන්න බලන් උඩ හඳ පායන්නේ
අපේ මැතිඳු මුව සිනහව වැන්නේ
අනේ කොයිබදැයි උන් දැන් ඉන්නේ
ඇයි බොල මැති සබයේ නොවැ ඉන්නේ

චන්දෙට පෙර දින කුමක්ද කීවේ
හඳෙන් හාල් ගෙන දෙනවැයි කීවේ
චන්දෙ දිනූ පසු කුමක්ද කීවේ
හඳත් රාහුටම ගියාය කීවේ

දොරින් දොරට ගම දෙපා ගෑටුවේ
චන්දෙට කලිනුයි අත ලෙවකෑවේ
දියවන්නාවෙන් පීනා ආවේ
අපේ කතිර බලයෙන් යැයි කීවේ

කොඩි සේසත් ලෙලදෙන මැති සබයේ
වායු සමන කල පහසු මැදිරියේ
දැයට සේවයට ඔවුන් ගිවිසියේ
බඩ රැකුමට යැයි කුමට කියනුයේ



# රොටෝරුවා අසිරිය

විශ්‍රාමලත් විදුහල්පති දිවංගත

## පියදාස කිර ඇල්ලයන්ගේ

කවි සංකල්පනාවක්

| | |
|---|---|
| පිබිදුනු මනස අනතුරු ජය ගත | යුතුය. |
| මේ අද රොටොරුවා වෙහි පවතින | තතුය |
| ඇසිද දිසා මානේ මල් හා එළවලු | වතුය |
| මෙහි මහ පොලොව බිය නැති මිනිසුන් | සතුය |
| | |
| ගස කොළ ගෙවතු මිනිසුන් හා සමග | අනේ |
| පොළොවට ගිලා බැසි තැන් මහ පොකුණු | පෙනේ |
| මේ ගම් දනව් ගිල ගනිමින් නොපා | සෙනේ |
| මිහිකත අනේ ඇයි මෙතරම් දරුණු | වුනේ |
| | |
| ආවාටයෙන් ගිනිදළු උඩ විදින | රඟේ |
| සමහරු දිය කෙළිති, ''උණුදිය'' ගලන | ගඟේ |
| සල් පිල් ගෙවතු හා දිගටම අතර | මඟේ |
| දුම් ගුලි ලෙලෙන මඩ වගුරෙන් බුබුළු | නැඟේ |
| | |
| බැලු බැලු දෙසින් පොළොවෙන්දුම් නගිනු | පෙනේ |
| පැතිරෙන 'ගෙදන්ගම් ගඳ ' ගව් ගනනේ | දැනේ |
| ලෙළදිදි බුබුළු මතුවන මඩ වගුරු | කොනේ |
| සුවසේ වෙසෙන ලස්සන මහ මැදුරු | තැනේ |
| | |
| මිහිකන පලා මතු වූ දළුව | ඉබේ |
| අවිහින්සක මිනිස් ජීවිත නසා | තිබේ |
| මිනිසා තමන් ලද දස්කම් කරන | යුගේ |
| එම ගින්නෙන්ම විදුලිය උපදවනු | ලැබේ |
| | |
| ඇස ගැසූ කෙනෙහි මෙහි සුදු දුම් වළා | කුටී |
| දුටු හැම කෙනෙකුගේ ඇඟ කිළි පොලා | සිටී |
| නලයක් මගින් දුම් හරවා ගෙයක | සිටී |
| දුටුවෙමි කතක් සිය ආහාර පිසින | සැටී |
| | |
| නූතන මහා නගරෙක වැසි දනන් | වෙත |
| ලැබෙන පහසුකම් නොඩුව පිරි | ඇත |
| පය තබ තබා විසුවන් ගිනි ගොඩක් | මත |
| මෙහි මිනිසුන්ගේ සිත නම් ගිනි ගෙන | නොමැත |
| | |
| අක්කර දහස් ගණනින් පැතිරෙන | ලෙසට |
| මල් පලතුරු එළවළු ඇත වගා | කොට |
| සංචාරක පරිස් මඟ බලන | විට |
| 'මැණිකකි' රොටොරුවා නවසීලන්ත | යට |